# විසි එක්වන සියවසට ප්‍රතිසංවිධානය විය යුතු තරුණ ගොවි සමාජ

ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ
**විෂයානුගත විශේෂඥ කේ.බී. ගුණරත්න විසිනි.**

ශ්‍රී ලංකාවේ නොයෙකුත් සංවිධාන දැකිය හැක. නමුත් කෘෂිකර්මාන්තය පදනම් වූ තරුණ පරපුරේ හැකියාවන් වර්ධනය කිරීමෙහිලා උර දෙන සංවිධාන දුර්ලභ වීම රටේ අවාසනාවකි. තරුණ ගොවි සමාජ කලක් තරුණ පුරපුරේ සිත් ගත් මනා ක්‍රියාකාරිත්වයකින් යුක්ත වූ සංවිධානයකි. විසි එක් වන සියවසට ගැලපෙන අයුරින් ඒවා ප්‍රතිසංවිධානය වී ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

තරුණ ගොවි සමාජ වනාහි කිසිම දේශපාලන පක්ෂයකට, කිසිම ආගමකට කිසිම ජාතියකට අයත් වන හෝ සම්බන්ධ සංවිධානයක් නොවේ. තරුණ තරුණියන්ගේ හැකියාවන් දියුණු කිරීම සහ ඔප් නැංවීම සඳහා කැපවුණු සංවිධානයකි. මෙම සංවිධාන නිසා මෙතෙක් කිසිවෙකුට පෞද්ගලිකව හෝ පොදුවේ හානියක් සිදු වී නොමැත. සැම කෙනෙකුගේම හැකි සහාය ලැබෙන, කාටත් උපකාරී වන මෙම සංවිධාන වලට ග්‍රාමීය මට්ටමින් විශාල සේවාවක් ඉටු කළ හැකිය. මේ කාරණා නිසාම තරුණ ගොවි සමාජ අඛණ්ඩව වසර 50 කට වැඩි කලක් නොකඩවා පවත්වා ගෙන එනු ලබයි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය වරයා වූ ඩී.එස්. සේනානායක මහතාගේ අදහසක් අනුව එතුමාගේ මූලිකත්වයෙන් 1950 වසරේ කොළඹදී තරුණ ගොවි සමාජ ව්‍යාපාරය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යාමේ කාර්‍යභාර්ය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. එදා සිට අද දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ මෙම තරුණ ගොවි සමාජ ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන එනු ලබයි.

ලෝකයේ වෙනත් රටවලද තරුණ ගොවි සමාජ දැකිය හැකිය. ඒවා වෙනත් නම් වලින් හඳුන්වනු ලබයි. අමෙරිකාවේ 4 - එච් ලෙසද, එංගලන්තයේ වයි.එෆ්.සී. ලෙසද බොලිවියාවේ 4 - එස් ලෙසද මෙම ව්‍යාපාරය දැකිය හැක. ලෝකයේ මුල්ම තරුණ ගොවි සමාජය ආරම්භ වූයේ අමෙරිකාවෙහිය. ඒ 1903 වර්ෂයේ ඉයෝවා ප්‍රාන්තයේදීය. 4 - එච් නමින් මෙම ව්‍යාපාරය ඇමෙරිකාවේ ආරම්භ වූයේ ඉංග්‍රීසි එච් (HEAD) අත් (HAND) හදවත (HEART) සහ සෞඛ්‍යය (HEALTH) යන කරුණු පදනම් කරගෙනය.

පළමු එච් අකුර හෙවත් හිස යන්නෙන් අදහස් කරන්නේ තරුණ තරුණියන්ගේ බුද්ධිමත් භාවයයි. යහපත් කටයුතු සිදු කිරීමට යහපත්, සන්සුන් නිවැරදි තීරණ ගන්නා මැදිහත් සිතින් යුත් මනසක් අවශ්‍යයි.

යහපත් හිසක් ඇති මිනිසෙකුගෙන් ඉටුවන කාර්‍යය ද යහපත් එකකි. එය ඉටු කිරීමෙහිලා යහපත් අත් දෙකක් අවශ්‍යය. එනම් කාර්‍යශූර කායබලයෙන් යුත් දෑතින් ශ්‍රමය කැප කළ යුතුය. එබැවින් දෙවන එච් අකුරෙන් කියවෙන දෑත් මෙම කාර්‍ය සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ.

තෙවන එච් වලින් අදහස් කරනුයේ හොඳ හදවතක් තිබිය යුතු බවය. හොඳ හදවතක් ඇති අයෙකුගේ යහපත් සිතිවිලි පහල වේ. යහපත් ගති පැවතුම් ඇති මානය, ක්‍රෝධය ඊර්ෂ්‍යාව දුරු කළ නිහතමානී අවංක තැන්පත් හදවතක් තරුණ තරුණියන්ට තිබිය යුතුය. එසේ වුවහොත් මනා විනයක් අප සමාජය තුල ඇති වේ. රටේ කොඳු නාරටිය වන තරුණ පරපුර සමාජයටත් රටටත් වැඩදායී වන්නේ එලෙස ක්‍රියා කිරීමෙනි.

මෙම සියලු කාර්‍යයන් කිරීම සඳහා හොඳ සෞඛ්‍යය ශරීරයක් අවශ්‍යය. නිරෝගී තරුණ පරපුරක් මගින් රටක් මැනවින් සංවර්ධනය කළ හැක. බුදුරජාණන් වහන්සේද "ආරෝග්‍යා පරමා ලාභා" යනුවෙන් දේශනා කළේ යමෙකුගේ නිරෝගී භාවය ඉතා වැදගත් බවයි. ඒ අනුව යහපත් හිසකින්, යහපත් හදවතකින් යහපත් දෑතක් දිගු කොට නිරෝගී කයකින් රටක සංවර්ධනය හා ප්‍රගතිය වෙනුවෙන් තරුණ පුරපුරේ වගකීම හා යුතුකම තරුණ ගොවි සමාජ ව්‍යාපාරය තුලින් සංවිධානාත්මකව ක්‍රියාත්මක කෙරේ.

## අප රටේ ක්‍රියාත්මක වන තරුණ ගොවි සමාජ වල අරමුණු කිහිපයකි.

1. ග්‍රාමීය තරුණ තරුණියන්ට ප්‍රායෝගික දැනුමක් ලබාදීම එක් අරමුණකි. මේ අනුව ඔවුන් තනි තනිව වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය. ඒ තුලින් ලබනු අත්දැකීම් මත ස්වයං ව්‍යාපාරයක් හෝ ස්වයං රැකියාවක් කළ හැක.

2. කෘෂිකර්මය පිළිබඳ දැනුම තාක්ෂණය, හුරුව සහ නව සොයා ගැනීම් ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්ත කිරීම තවත් අරමුණකි. ගතානුගතික ක්‍රම හා සම්ප්‍රදායන් ගෙන් වැඩිහිටි පරපුර මුදවා 'නව සොයා ගැනීම් තාක්ෂණ යෙදවීම් හා නව වගාවන් සඳහා වැඩිහිටියන් පොළඹවා ගැනීම මින් අදහස් කෙරේ. කෘෂිකර්ම ව්‍යාප්ති සේවයටද මෙය රුකුලකි.

3. ගමේ සුභ සිද්ධිය සඳහා තරුණ තරුණියන් යොදවා ගැනීම තවත් අරමුණකි. ගමේ පොදු හා කෘෂිකර්ම කටයුතුල වලදී තරුණ තරුණියන්ගේ ශ්‍රමය හා කාලය යොදා ගත හැක. මෙයින් ගම හැදේ, එවිට රට හැදේ.

4. අධ්‍යාත්මික ගුණ වගාව දියුණු කිරීමට යොදා ගත හැක. අන්ධානුකරණයට භාජනය වෙමින් පවතින මෙවන් යුගයක අපේ සංස්කෘතිය, ආගම් ජාති රැකගැනීමට හුරු කිරීම සඳහා තරුණ ගොවි සමාජ තුලින් මනා පිටුවහලක් ලැබේ.

5. අනෙක් අරමුණ වන්නේ තරුණ තරුණියන්ගේ උපන් හපන්කම් මතු කර ගැනීමට හා ඒවා දියුණු කර ගැනීමට උපකාරී වීමයි. සංවිධානාත්මකව වැඩ සටහන් වාද විවාද, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් අත්කම් මැහුම් ගායනා වාදන ක්‍රීඩා ආදිය තුලින් ග්‍රාමීය තරුණ පරපුරේ සැඟවී ඇති උපන් හපන්කම් ඔප් නංවා ඔවුනට තැනක් ලබා දිය හැක.

6. තරුණ තරුණියන්ගේ විවේක කාලයෙන් උපරිම ඵල නෙලා ගැනීම තවත් අරමුණකි. සාමුහිකව වැඩ කොට ආදායමක් ලැබිය හැකි කාර්‍යයකට යොමු කළ හැක. මෙය තමාටත් රටටත් සමාජයටත් වැඩදායකය.

7. සමගිය සමාදානය ගම්වල දියුණු කිරීම තවත් අරමුණකි. නොයෙකුත් හේතු මත භේද භින්න වී ඇති කොටස් ඒකරාශි කොට සාමූහිකව පොදු අරමුණක් කරා මෙහෙයවීම මෙයින් සිදු කෙරේ. එදා අප රටේ තිබූ සාමය සමගිය සමෘද්ධිය අද දැකිය හැකි නොවේ. එබැවින් එම කරුණු සපුරාලීමට විකල්පයක් අවශ්‍ය කෙරේ. ඒ සඳහා තරුණ ගොවි සමාජ වලින් ඉටු කළ හැකි කාර්යය සුළු පටු නොවේ.

8. ආත්ම තෘප්තියක් නායකත්වයක් ලබා දීම මෙහි තවත් අරමුණකි. ප්‍රයෝජනවත් ඵලදායී කාර්යයක නියැලීමෙන් විශාල ආත්ම තෘප්තියක් ලබාගත හැක. එසේම සංවිධානය කරන වැඩ සටහන් නිසා ජය පරාජය දුක සැප ලාභ අලාභ කීර්ති ප්‍රශංසා ලබා මෙහෙයවා නායකත්වයට හුරුවක්ද ඇති වේ.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. එමෙන්ම අප රට සතු සම්පත් බොහොමයකි. අප රටේ ලබා ගත හැකි තරුණ ශ්‍රමය අති විශාලය. එම ශ්‍රමයෙන් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නායකත්වය හා මෙහෙයවීම කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත කර්මාන්ත තුලින් ලබා දිය හැක. ඒ සඳහා අවශ්‍ය නිවැරදි මග පෙන්වීමකි. ඒ කාර්යභාරය තරුණ ගොවි සමාජ වලට මැනවින් ඉටු කළ හැක. නැති වී ගිය සාමය, සමගිය, සමාදානය යළි ගොඩ නගා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට අවශ්‍ය මැදිහත් සන්සුන්, බුද්ධිමත් කාර්යශූර දිරිය, ශ්‍රමය තරුණ ගොවි සමාජ තුලින් ලබා ගත හැකි බව මෙහිලා සඳහන් කළ හැක. මේ අනුව විසි එක්වන සියවසේ ගමන් ගන්නා අපි තරුණ ගොවි සමාජ දෙස ආපසු හැරී බලා මෙම සියවසට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානාත්මකව ඉදිරියට යා යුතුය.

# මමත් ගොවියෙක්

## - බුදුරජාණන් වහන්සේ -

කිසියම් ධර්මකාරණයක අර්ථය පැහැදිලි කිරීම සඳහා මෙන්ම ප්‍රතිවාදියාගේ තර්කයේ හිස්බව දැක්වීම සඳහා බුදුරජාණන් වහන්සේ උපමා හෝ උපමා කථා ගෙනහැර පෑහ. ගොවිතැනට අදාලව ගෙන හැර පෑ එක් උපමාවකි මේ.

එක් කලෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මගධ රට දක්ෂිණ ගිරියෙහි "ඒක නාලා" නම් බමුණු ගමෙහි වැඩ සිටියේක. එක් දිනක් කසීභාරද්වාජ බමුණාගේ කුඹුර සීසාන දිනය යෙදිණ. නගුල් පන්සියයක් සී සෑමෙහි යොදවා තිබූ අතර බුදුරජාණන් වහන්සේ පෙරවරුවෙහි පා සිවුරු ගෙන කසීභාරද්වාජගේ කුඹුර වෙත වැඩි සේක.

බමුණා ආහාර ගන්නා අතර පිඩු පිණිස වැඩ සිටිනා බුදුරජාණන් වහන්සේ දුටුවේය.

"ශ්‍රමණය මම වපුරන, සීසාන කෙනෙක්. වපුරලා සීසාලා තමයි කන්නේ. ඔබවහන්සේත් වපුරන්න. සීසාන්න. වපුරලා සීසාලා කන්න."

"බමුණ මමත් වපුරනවා, සීසානවා, වපුරල සීසාල තමයි කන්නේ."

"මොනවා! ඔබ වහන්සේගේ නගුලවත්, හීවැලවත්, කෙවිටවත්, ගොණුන්වත් මම නම් කවදාවත් දැකලා නැහැ. ඒ වුනාට වපුරල සීසාලා කනවලු. පුදුම කථාවක්නේ. කෝ ඔබ වහන්සේගේ ගොවි උපකරණ?

"බමුණ මගේ බිත්ත වී තමයි ශ්‍රද්ධාව. තපස තමයි වැස්ස. නුවණ තමයි විය දණ්ඩ හා නගුල. ලැජ්ජාව තමයි නගුලිය. හිත තමයි යොත. සිහිය තමයි හී වැල සහ කෙවිට කාය හා වාක්සුචරිතය ඇත්තෙක් වෙමි. සිව්පසෙහි පමණ දැන වළඳන්නෙමි. සත්‍ය තෘණච්ඡේදනය කරමි. අර්හත් ඵල විමුක්තිය මගේ මිදීමයි. නිවණ දක්වාම මගේ වීර්යය පවතී. මේ මාගේ සී සෑමයි. එසේ සී සෑමෙන් නිවන් සුවය නැමැති අස්වැන්න ලබමි."

- බුදුහාමුදුරුවන්ගේ උපමා කථා ඇසුරෙනි -